# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1802/23 - 2013 මාර්තු මස 23 වැනි සෙනසුරාදා - 2013.03.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### කයිට්ස් ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධූරයේ පුරප්පාඩුවක් පිරවීම

අවසරය ලබානොගෙන මාස තුනක කාලසීමාවක් සභාවේ රැස්වීම්වලට සහභාගී නොවීම හේතු කොට ගෙන කයිට්ස් ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

කන්දඥානි කතීස්සන් නම් වූ සභිකයා අයත්වන්නා වූ එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් ට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයකු වශයෙන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත්, ඒ කයිට්ස් ප්‍රාදේශීය සභාවේ සභිකයෙකු වශයෙන් තේරීපත්වීම සඳහා සුදුසුකම් ලත් තැනැත්තෙකු නාමයෝජනා කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා සුදුසුකම් ලත් තැනැත්තකු වන ජෝන්පිල්ලෙයි ඇන්ටන් චාල්ස් ජැන්සන් මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

කයිට්ස් ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී සිවසුබ්‍රමණියම් අච්චුදන් වන මම, ජෝන්පිල්ලෙයි ඇන්ටන් චාල්ස් ජැන්සන් මහතා කයිට්ස් ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

එස්. අච්චුදන්,
තේරීම්භාර නිලධාරී,
කයිට්ස් ප්‍රාදේශීය සභාව.

2013 මාර්තු මස 13 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
යාපනය.

04 - 278

---

### පේදුරුතුඩුව ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධූරයේ පුරප්පාඩුවක් පිරවීම

මිය යාම හේතු කොට ගෙන පේදුරුතුඩුව ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

පොන්නයියා තිරුචෙල්වම් නම් වූ සභිකයා අයත්වන්නා වූ ඉලංකෙයි තමිල් අරසු කච්චි නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් ට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයකු වශයෙන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත්, ඒ පේදුරුතුඩුව ප්‍රාදේශීය සභාවේ සභිකයෙකු වශයෙන් තේරීපත්වීම සඳහා සුදුසුකම්ලත් තැනැත්තෙකු නාම යෝජනා කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා සුදුසුකම් ලත් තැනැත්තකු වන තුරයිසාමි මදියලකන් මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;


1A - G 17458 — 380 (2013/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

පේදුරුතුඩුව ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී සිවසුබ්‍රමණියම් අච්චුදන් වන මම, තුරයිසාමි මදියලකන් මහතා පේදුරුතුඩුව ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

එස්. අච්චුදන්,
තේරීම්භාර නිලධාරී,
පේදුරුතුඩුව ප්‍රාදේශීය සභාව.

2013 මාර්තු මස 14 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
යාපනය.

04 - 279

---

## වලිකාමම් නැගෙනහිර ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධූරයේ පුරප්පාඩුවක් පිරවීම

මිය යාම හේතු කොට ගෙන වලිකාමම් නැගෙනහිර ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

තර්මලිංකම් ක්‍රිෂ්ණරාසා නම් වූ සභිකයා අයත්වන්නා වූ ඉලංකෙයි තමිල් අරසු කච්චි නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් ට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයකු වශයෙන් තෝරා පත් කර ගන්නා ලැදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත්, ඒ වලිකාමම් නැගෙනහිර ප්‍රාදේශීය සභාවේ සභිකයෙකු වශයෙන් තේරීපත්වීම සඳහා සුදුසුකම්ලත් තැනැත්තෙකු නාමයෝජනා කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා සුදුසුකම් ලත් තැනැත්තකු වන තම්පිරාසා සියාමා මහත්මිය ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

වලිකාමම් නැගෙනහිර ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී සිවසුබ්‍රමණියම් අච්චුදන් වන මම, තම්පිරාසා සියාමා මහත්මිය වලිකාමම් නැගෙනහිර ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

එස්. අච්චුදන්,
තේරීම්භාර නිලධාරී,
වලිකාමම් නැගෙනහිර ප්‍රාදේශීය සභාව.

2013 මාර්තු මස 14 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
යාපනය.

04 - 280

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.